# හුන්නස්ගිරිය කන්ද (මැදමහනුවර කන්ද)

**ගමනේ අරමුණ:** 2015 වසරේ අවසන් සංචාරය ලෙස මෙම කන්ද තරණය කිරීම, ඉතිහාසය අධ්‍යයනය හා ජායාරූප ගැනීම

**සංචාරය කල දිනය :** 2015දෙසැම්බර් 25 නත්තල් දා

**සහභාගීවූවන් ගණන:** 3 යි (නිශාන් කුළසිංහ, ලසිත රත්නායක, අරුණ සුගතපාල)

**ගමන් කල ආකාරය:** පොදු ප්‍රවාහන බස් රථ හා ත්‍රිරෝද රථ මගින් සහ පා ගමනින්

**විශේෂ ස්තුතිය:** ලසිත රත්නායක (අස්ගිරිය සිය නිවසේදී ආහාර සැපයීම සහ ප්‍රවාහන පහසුකම් සැපයීම)

**ගමනේ ස්වභාවය:** එක් දින සංචාරයකි. කන්ද මුදුනට යාමට ඇතැම් ස්ථාන වල පැහැදිලි අඩි පාරක් නොමැති වීම නිසා අතරමං වීමට ඉඩ ඇත. මග පෙන්වන්නකු සිටින්නේ නම් වඩා සුදුසුය. කන්දේ නැග්ම හා බාධක ආදිය නිසා ගමන තරමක් අපහසු දායකයි. ඔබ ශාරීරිකව නිරෝගීමත්ව සිටිය යුතුය.

**ඇතුල්වීම:** විශේෂ අවසරයක් අවශ්‍ය නොවේ. මග පෙන්වන්නෙකු නොමැතිව යන්නේ නම් අදාල පොලිස් ස්ථානය දැනුවත් කිරීම සුදුසුය.

www.LakViskam.org

**ජායාරූප හා වාර්තාව:** නිශාන් කුළසිංහ විසිනි

**ගමන් මාර්ග:** **ඇල්කඩුව හුන්නස්ගිරි වතු යාය දෙසින්:**

මහරගම > අවිස්සාවේල්ල > කෑගල්ල > මහනුවර > වත්තේගම > ඇල්කඩුව දෙසට> හුන්නස් දිය ඇල්ල පාර > හුන්නස්ගිරි වතුයාය >හුන්නස් ෆෝල්ස් දිය ඇල්ල පසුකර> සභාය පාලක නිලධාරියාගේ බංගලාව හා විකාශන කුළුණු වෙත දිවෙන හන්දිය > සෙන්ගසාධු ගම්මානය > හුන්නස්ගිරිය කඳු මුදුන

**පන්විල දෙසින්:**

මහනුවර > වත්තේගම > බඹරැල්ල දෙසට > පන්විල > හාතලේ තේ වත්ත හරහා > හුන්නස්ගිරිය කඳු මුදුන

(GPS ගමන් මාර්ගය (kml file), ජායාරූප හා වීඩියෝ වැඩසටහන, මෙම වාර්තාව අවසානයේ දක්වා ඇති යොමු වලින් ලබා ගන්න)



ඇල්කඩුව - හුන්නස්ගිරි වතු යාය දෙසින් ගමන් මාර්ගය

www.LakViskam.org

## පරිසරය පිළිබඳව

මෙම ප්‍රදේශය කඳුකර, ශීත-උණුසුම් දේශගුණය සහිත වනාන්තර වලින් පරිපූර්ණ, ජල පෝෂක ප්‍රදේශයකි. මීදුමෙන්, වලාකුළෙන් වැසී යන තද සුළං සහිත තෙත් ප්‍රදේශයකි. කූඩැල්ලන් බහුලව දක්නට ඇත. වනාන්තරය තුල දිවියා, වල් ඌරා, මී මැස්සා ආදී අනතුරුදායක සතුන් ගැවසිය හැක. අඩිපාර හා පොලොවේ ඇතැම් ස්ථාන ලිස්සන හා එරෙන සුළුය. මේ සියලු පරිසර තත්වවලට පෙර සූදානමක් ඇතිව ඇඳුම්, උපකරණ හා බෙහෙත් ආදිය රැගෙන එහි යන්නේ නම් මැනවි.

## ඉතා වැදත් කාරුණික ඉල්ලීමයි

ඔබ හුදු විනෝදය සඳහා පමණක් එහි යන්නේ නම් මෙම පරිසර පද්ධතිය ඔබ ඇතුළු සියලු ජීවී ප්‍රජාවගේ උරුමයක් නිසා එය ආරක්ෂා කර ගතයුතු බවට නිරතුරු සිහිතබා ගන්න. වෙනත් කටයුත්තක් සඳහා එහි ගියද පරිසරය ආරක්ෂා වන අයුරින් කටයුතු කරන්න. විශේෂයෙන් ගිනි මැල දැල්වීමෙන් වලකින්න. සිගරට් භාවිතා නොකරන්න. සිගරට් කොට වැටීමෙන් වියලි කොල, පඳුරු පහසුවෙන් ගිනිගනී. පැළෑටි, ශාඛ වලට හා සත්වයින්ට හානි නොකරන්න. ප්ලාස්ටික් ඇතුළු සියලු අපද්‍රව්‍ය ප්‍රදේශයට ගෙන යාම සීමා කර ගන්න. ඒවා එම ප්‍රදේශයේ බැහැර නොකර ආපසු ගෙනවිත් නිසි ස්ථානයකදී පමණක් බැහැර කරන්න. ඔබ මත්පැන් පානය කර මෙම ප්‍රදේශවල සංචාරය කිරීමෙන් වලකින්න. එය ඔබගේත් පරිසරයේත් එහි වෙසෙන සමස්ථ ජීවී ප්‍රජාවගේත් යහපතට ඉවහල් වේ. ජලය හැර පරිසර පද්ධතියෙන් කිසිවක් ලබා නොගන්න. මේ පරිසර පද්ධතිය සියලු ජීවී ප්‍රජාවගේය. එම

නිසාවෙන් එම පරසරය සුරකින්න. අපෙන් පසුවට එන ජීවී ප්‍රජාවටත් එය ආරක්ෂාකර තබන්න. මෙය 'ලක් විස්කම්' ඔබෙන් කෙරෙන ඉතා බැගෑපත් ඉල්ලීමයි!

**හුන්නස්ගිරිය සම්බන්ධ තොරතුරු හා එහි ඉතිහාසය**

නකල්ස් රක්ෂිතයේ නිරිත දිග කැම්ප්බෙල් ලේන් වන රක්ෂිතයේ කෙළවරක හුදකලාව පිහිටා ඇති උසින් මීටර් 1512m ක් වන හුන්නස්ගිරිය මහනුවර හා මාතලේ දිස්ත්‍රික්ක වලට අයත් වේ. මෙම කන්ද මුදුනෙන් මාතලේ හා මහනුවර දිස්ත්‍රික්ක වෙන් කරන දිස්ත්‍රික් මායිම වැටී තිබේ. රවන් ඔය, මහ ඔය ආදී ජල මාර්ග මෙම කන්දෙන් උපත ලබා මහවැලි ගඟට එකතු වේ. මෙම ජල මාර්ග ආශ්‍රයෙන් රහස් ඇල්ල (රාස්ස ඇල්ල), දූවිලි ඇල්ල, වවුලු ඇල්ල නිර්මාණය වේ. රවන් ඔය නාමය රාවනා ඉතිහාසය හා සබැඳුණු එකක් බවට අදහසක් පවතී. හුන්නස්ගිරිය කඳු වැටියේ බෑවුම් ප්‍රදේශ වලින් අඹන් ගඟ ද උපත ලබයි.

ගෞතම බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ලංකා ගමනය සිදුවූ බින්තැන්න නොහොත් මහියංගනය රාවනා රාජ සමයේ සිට යක්ෂ ගෝත්‍රිකයින් බහුලව විසූ පෙදෙසක් විය. නාග හා යක් ගෝත්‍රිකයින් අතර ඇති වූ යුද්ධය සන්සිඳීමේ අරමුණින් බුදුන් වහන්සේ බින්තැන්නට වැඩම කළහ. එහිදී පැ පෙළහර දැක සමහර යක්ෂ ගෝත්‍රිකයින් බියට පත් වී ගිරි දිවයිනට පලා ගිය බවට වංශ කතා වල සඳහන් වේ. පලා ගිය සමහරෙක් හුන්නස්ගිරිය කන්දේ සැඟවුණු බවට මතයක්ද ඇත. හුන්නස්ගිරිය කන්ද වාසභවන කර ගත් එක්තරා දේවතාවියක් ගොවියකු හා විවාහ වූ ජන කතාවක් දුම්බර මිටියාවත ආශ්‍රිත ගම් වල වැසියන් දනී. එසේම හුන්නස්ගිරිය ප්‍රදේශය ආශ්‍රිතව වාසය කල යක්ෂ ගෝත්‍රික නායකයින් පිළිබඳවද ජනකතා වල කියවේ. කැපී පෙනුන ඇතැම් යක්ෂ ගෝත්‍රික චරිත පසුකාලීනව දේවත්වයෙන් පිදීමට ආදී ජනතාව පෙළඹුනේ යයි අනුමාන කල හැක. හුන්නස්ගිරිය කන්දේ විසූ කඩවර කළු බණ්ඩාර දෙවියන් වැදී නායකයකු ලෙස කැපී පෙනුනෙකි. මේ බැව් බින්තැන්නේ කාරි කවියක මෙසේ කියවේ.

හුන්නස්ගිරිය කන්දේ කොටතී  
දුන්නක් අරගෙන දඩයම් කරතී  
දඩයම් කල තැන විමසා බලතී  
කළු බණ්ඩර දෙවි යහනට වඩිතී

www.LakViskam.org

සිය මාමා වරුන්ගෙන් ගැලවීමට පණ්ඩුකාභය කුමරු කලක් මෙම ප්‍රදේශ ආශ්‍රිතවද සැඟ වී සිට ඇත. ඔහුට රජකම ලබා ගැනීමට යක්ෂ ගෝත්‍රිකයින් බොහෝ සේ උදව් කර ඇත. එක්තරා දිනක හුන්නස්ගිරිය කඳු මුදුන මීදුමෙන් වැසී ඇති අයුරු දැක ඊට වශී වූ කුමරු එම ප්‍රදේශය දුම්බර පෙදෙස ලෙස හැඳින් වූ අයුරු ජන කවියක මෙසේ එයි.

දුම්බර තුරු වසා මී දුම ගැගුවන් වට  
සම්බර රුක් හුන්නස්ගිරි උස් මුදුන් සිට  
ගම්බර නිරිඳු පඩුකාභය නමින් සිට  
දුම්බර යැයි පැවැසූ එනිරිඳු එතැන් සිට

පාලි රසවාහිනී ග්‍රන්ථයට/සද්ධර්මාලංකාර මේඝවර්ණ වස්තුවට අනුව මලියදේව රහතන් වහන්සේ හට ඇප උපස්ථාන කල මේඝවර්ණ දෙවිඳුන් හුන්නස්ගිරි කන්දේ (උදුම්බගිරි) ගල් ලෙනක වාසය කල බවට සඳහන්ය (උදුම්බගිරි යනු දිඹුලාගල පර්වතය යයි මතයක්ද ඇත). පසුව මේඝවර්ණ දෙවිඳුන් මලියදේව හිමි සමග කොත්මලේ පුසුල්පිටිය ප්‍රදේශයට ගොස් ඇත. වත්තේගම - ඇල්කඩුව මාර්ගයේ පසෙක පිහිටි මලියදේව හිමි වැඩ සිටි බවට පැවසෙන කටාරම් සහිත මලියදේව ආරණ්‍ය ගල් ලෙන නම් ලෙනක් අදත් දක්නට ඇත.

සොරබොර වැවේ නිර්මාතෘ ලෙස සැලකෙන "බුලතා" නම් යෝධ ශරීරයක් ඇති පුද්ගලයා හා ඔහුගේ බිරිඳ ජීවත්ව සිට ඇත්තේද හුන්නස්ගිරි කන්ද පාමුල කිරිපට්ටිය නම් ගම්මානයේය. සොරබොර වැව සාදන කාලයේ බුලතා හට බත බුලත ගෙන ගියේ ඔහුගේ යෝධ බිරිඳ විසිනි. මෙසේ ඔවුන් දෙදෙනා වැවට ආ ගිය මාර්ගය, වැවෙන් විශාල කළු ගල් ගෙනවිත් ගල් පඩි ලෙස සකස් කර නිර්මාණය කර තිබුණි. අදත් එම ගල් හුන්නස්ගිරිය කිරිපට්ටිය ගමේ සිට ගල් පඩිගල ගම හරහා ඇති පැරණි මාර්ගයේ දක්නට ඇත.

සිංහලයේ අවසන් රජු ලෙස සැලකෙන වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු විනෝදාංශයක් වශයෙන් මී ගොන් පොර මහත් ප්‍රිය කළේය. රජු සතුව සිටි දක්ෂ මී ගොනෙකු වූ "දඹරා" නම් මී ගොනා පැරදවීමට සමත් මී ගොනෙකු එකල නොවීය. රජ වාසල පවත්වන ගොන් පොරය සඳහා දඹරා සමග සටනට අඩබෙර ගසා සුදුසු මී ගොනෙකු සොයා බලා ඇත. තරගයට ඉදිරිපත් වන්නාවූ මී ගොනා ජයග්‍රහණය කළහොත් හිමිකරුට තෑගී හා තනතුරු පිරිනමන බවට සැල කර සිටින ලදී. මහියංගනයේ ජීවත් වූ පුද්ගලයකු සිය දක්ෂ මී ගොනා සමග සටනට ඉදිරිපත් විය. එම මී ගොනා හමුවේ දඹරා වෙනදා මෙන් සටන් නොකර මග හැර ගියේය. එවිට ප්‍රතිවාදියා දරුණු ලෙස පහර එල්ල කිරීම නිසා රජුගේ මී ගොනා පරාජය විය. මේ පිළිබඳව සැක සිතූ රජු මහියංගනයේ සිට පැමිණි ප්‍රතිවාදී ගොනා පරීක්ෂා කරද්දී උගේ සිරුරේ ඌරු තෙල් ගල්වා ඇති බවට සොයා ගනී. මෙයින් කිපුණු වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු විසින් ඔවුන්ට දඩුවම් නියම කරන ලදී. ජනශ්‍රැතියේ කියවෙන්නේ ප්‍රතිවාදී මී ගොනා හා උගේ අයිතිකරු හුන්නස්ගිරිය කඳු මුදුනට ගෙන ගොස් කන්දෙන් පහලට තල්ලු කර මරා දමන ලද බවටයි.

හුන්නස්ගිරිය අතීතයේදී මැදමහනුවර කන්ද ලෙස හඳුන්වා ඇති බවට ජනප්‍රවාද වල කියවේ. ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා ඉංග්‍රීසීන්ගෙන් බේරීම සඳහා මැදමහනුවර කන්දේ තිබුනේ යැයි පැවසෙන "අහස් මාලිගාවේ" සැඟවීමට යන අතරවාරයේ බෝමුරේ උඩුපිටිය ගමේදී අත් අඩංගුවට පත් විය. 1815 පෙබරවාරි 18 දින එලෙස ඉංග්‍රීසීන් හට රට අල්ලා ගැනීමට හැකි වීම නිසා ලාංකීය රජ වංශයේ අවසානයද එදිනට සනිටුහන් වී ඇත. ජනප්‍රවාද අනුව බෝමුරේ තිබූ අලංකාර දිය ඇල්ලකට යටින් රහස් උමං මාර්ගයක් තිබී ඇත. මෙම මාර්ගය රජු හා සමීපතමයින් කිහිපදෙනෙකු හැරෙන්නට කිසිවෙකු දැන සිට නොමැත. රජු ගලා හැලෙන දිය ඇල්ලේ ජල පහරට තල් අත්තක් ඇල්ලූ විට ජලය මැත් වී ඇතිවන ඉඩෙන් ඇතුලට ගිය විට උමං ද්වාරය විවෘත කර ගත හැකිව තිබී ඇත. මෙම උමග ඔස්සේ මැදමහනුවර කන්දේ මුදුනේ ඇති "අහස් මාළිගයට" පිවිසිය හැකි බවට කිය වේ. කෙසේ හෝ අදාල දින තල් අත්ත අල්ලද්දී බලාපොරොත්තු වූ පරිදි උමං ද්වාරය දිස් නොවූ නිසා උමං මග අතහැර පසු දින කන්ද තරණය කිරීමට තීරණය කර බෝමුරේ උඩුපිටිය ගමේ නවාතැන් ගෙන ඇත. බෝමුරේ ප්‍රදේශයේ අද එවන් දිය ඇල්ලක් දක්නට නැතත් දොරබෝමුරේ නමින් ස්ථානයක් ඇත. මෙම ජනප්‍රවාදයට අමතරව මෙම කන්දේ ඇති අද්භූත කළුදිය පොකුණක් පිළිබඳව ගැමියන් අතර මෙවන් කථාවක් ඇත. අතීතයේ කුඹුරු වැඩකටයුතු සඳහා ගොවියන් ගවයින් විශාල වශයෙන් භාවිතා කරන ලදී. එක් කන්නයක වැඩ කටයුතු අහවර වූ පසු මෙම ගවයන්ට හුන්නස්ගිරිය කඳු කැලෑවට යාමට ඉඩ සලස්වයි. එසේ එම සතුන් මාස ගණන් කැලේ ජීවත් වේ. මීළඟ කන්නයට ගොවියන් කැලෑවට ගොස් එම හරක් රංචු නැවත රැගෙන එයි. පුංචි රාල නම් මහලු ගොවියා එසේ ගව රංචුව සොයා කැලේ වැදුනත් උන් සොයා ගැනීමට අපහසු විය. පසු දිනද නැවත කැලෑ වැදී කඳුමුදුනට ගමන් ගත් ඔහුට රවන් ඔයේ දූවිලි ඇල්ලෙන් නැගෙන ශබ්ධය අසා එම ඉසව්වට ගියේය. එවිට මෙම කළු පැහැති වතුර උතුරන පොකුණ දැක ඇත. මන්සිය නිසා එම පොකුණෙන් ස්නානය කල පුංචි රාල ටිකෙන් ටික තරුණ ස්වභාවයකට පත් වී තිබුණි. පසුව ඔහුගේ බිරිය මෙම රහස දැනගෙන ඇයටත් ස්නානය පිණිස එම කළු පොකුණට කැටුව යන ලෙස ඉල්ලා සිටියාය. දෙදෙනාම දූවිලි ඇල්ල ප්‍රදේශයට ගොස් කොතරම් සෙව්වත් එම කළු දිය පොකුණ හමු නොවීය. පසුව අදහස වෙනස් කරගෙන ඔවුන් ආපසු සිය නිවස බලා ගියේලු. එකල පොකුණ අසල දුර්ලභ කළුනික පඳුරක් තිබී ඇති අතර අද එවැනි පඳුරක් හෝ දක්නට නොමැත. එසේ වුවද කළු දිය පොකුණක් අදත් එම ප්‍රදේශයේ ඇත.

හුන්නස්ගිරිය ඇතුළුව අවට කඳු ගැන කියවෙන ජන කවියක්

බතට කන්න බැරි බතලේගල කන්ද
අලට කන්න බැරි අලගල්ලේ කන්ද
හුනට කන්න බැරි හුන්නස්ගිරි කන්ද
මේ කඳු තුනට නායක සමනළ කන්ද

**ගමනට පිටත්වෙමු**

මෙම ගමනට අප තුන් දෙනෙකු සහභාගී වුවද කොළඹ සිට ගමන් ආරම්භ කලේ මා පමණි, ඉතිරි දෙදෙනා නුවර ප්‍රදේශයේ පදිංචි කරුවන් නිසා ඔවුන් මහනුවරදී මා සමග එකතු විය. මා මහරගම - මහනුවර උදෑසන 5.30 ට ගමන් ආරම්භ කල බසයෙන් අවිස්සාවේල්ල හරහා මහනුවරට පැමිණෙන විට උදෑසන 9 පමණ විය. අප මහනුවර සිට බසයකින් වත්තේගම දක්වා ගමන් ගත්තෙමු. මෙම ගමනේ දී කටුගස්තොට පාලම මතදී දකුණු පසින් ඈතට වන්නට අපගේ ගමනාන්තය, තරමක් උල් හැඩයක් සහිත හුන්නස්ගිරිය කන්ද දිස් විය. මේ වනවිට වෙලාව උදේ 9.45 විය. අප වත්තේගම සිට ඇල්කඩුව බසකින් ගොස් හුන්නස් ෆෝල්ස් හෝටලයට පිවිසෙන මාර්ගය අසලින්

www.Lakviskam.org

බැස ගත්තෙමු. එම ස්ථානයේ ඇති ත්‍රීරෝද රථයකින් 2.2 km ක් පමණ ගොස් හුන්නස්ගිරිය තේ වත්තේ ඉහල මහඔය කොටසේ (UMO Division) සහාය පාලක (superintendent) නිලධාරියාගේ බංගලාවට හා විකාශන කුළුණු වෙත යන යන හන්දියෙන් බැස උදෑසන 11 ට එතැන් සිට පයින් ගමන ආරම්භ කළෙමු. මෙම හන්දියේ සිට හුන්නස් ෆෝල්ස් හෝටලයට ඇති දුර මීටර් 500 කි.



විකාශන කුළුණු වෙත යන යන මාර්ගය



කුඩා දිය ඇල්ලක්

වතු ගම්මානයක්, විශාල නුග ගසක් හා ජල පහරවල් පසු කර කොන්ක්‍රීට් කර තිබූ මාර්ගය ඔස්සේ ඉහලට ගමන් කරන විට පහතින් කුඩා දිය ඇල්ලක් ද දැක ගත හැක. මෙම පා ගමනේදී දර්ශනීය තේ වතු, විවිධ වර්ණ වල අලංකාර මල් පිපුණු ගස්, ඈතින් පෙනෙන ඉහල හුන්නස් දිය ඇල්ලේ ජලාශයත්, පයිනස් ගස් වලින් හැඩ වුනු ඈත කඳු ආදියත් නෙත් සිත් පැහැර ගන්නවාට නොඅනුමානය. මෙසේ ගමන් කරන අතරවාරයේ හුන්නස්ගිරි කඳු වල සවි කර ඇති රූපවාහිනී හා ගුවන් විදුලි විකාශන කුළුණු ඈතින් දැක ගත හැක. කඳු ගැට දෙකක් තුලින් දිවෙන තියුණු වංගුවක් සහිත V හැඩති ස්ථානයක්ද මෙම පා ගමනේදී හමු වේ. අපට දහවල් 12 වන විට දැවැන්ත කළු ගල් තලාවක් සහිත පාර හරහා ගලා යන ජල පහරක් අසලට පැමිණිය හැකි විය. කන්දට යාමට මෙම ස්ථානයෙන් දකුණු පසින් ඉහලට දිවෙන පටු මාර්ගය ඔස්සේ ගමන් කල යුතුය. මෙම ප්‍රදේශය සෙන්ගසාධු ලෙස හඳුන්වයි. 'කතියායිනි' නම් දේවියගේ දේවාලයක් පසු කර නිවාස කිහිපයක් අසලින් කැලෑවට පිවිසිය යුතුය. දර කඩාගෙන පහලට ආ ගැමියෙකුගෙන් පාර අසා ගත් අප කුඩා පීල්ලක් සහිත ජලපහරක් සමගම ඇති බෑවුමක් සහිත කළු ගල් තලාව ඔස්සේ ඉහලට නැගිය යුතු වුවත් ගල් තලාව තෙත් ස්වභාවයකින් යුක්ත වූ නිසා වම් පස කැලෑව ඔස්සේ ගමන් ආරම්භ කළෙමු. මෙම තීරණය අප සාමාන්‍ය මාර්ගයෙන් ඈත් වී මග පාදාගෙන යා යුතු දුෂ්කර ගමනකට මුල පිරීමක් විය. කිසිදු අඩිපාරක් හෝ නොමැති කැලෑවේ ඉවෙන් මෙන් ගමන් කල අප පැය ගණනක අමාරු ගමනිකින් පසු සාමාන්‍ය අඩි පාරට එකතු විය. අප සතු GPS උපකරණයෙන් අප ගමන් කල මාර්ගය සටහන් කර ගත්තෙමු. මග දිගට දක්නට වුයේ කැලෑ ස්ට්‍රෝබෙරි, බෝවිටියා හා නොයෙකුත් අලංකාර මල් පිපී ඇති අයුරුය. කවදත් මෙන් සුපුරුදු ජීවනී පානය අපගේ පිපාසය හා විජලනයෙන් වැලක් වීය. වනාන්තරයේ බොහෝ තැන් වල දිය සීරාවන් දක්නට ලැබිණි.

www.lakviskam.org



කන්දේ අවසාන කොටසේ හමු වන ජල පහර



පහල කන්දේ ඇති විකාශන කුළුණු

ප.ව. 2 වන විට වන මැද හමුවන ප්‍රධාන දිය පහර පසු කිරීමට හැකි විය. ප.ව. 2.15 වන විට හාත්පසින්ම ඉතා හොඳ දර්ශන තලයක් සහිත කඳු මුදුනකට ලඟා විය හැකි විය. මෙම කඳු මුදුනේ සිට උඩින් තිබෙනා ප්‍රධාන කන්ද පෙනෙන අතර මහා ප්‍රපාතයක් සමග හුන්නස්ගිරි ඝන වනාන්තරය පහලින් දක්නට ලැබේ. නකල්ස් ඇතුළු ඈතින් පැහැදිලිව පෙනෙන කඳු පංති හා වික්ටෝරියා ජලාශය ඉතාමත් නෙත්කළු දර්ශනයක් විය. කන්දේ ඉතිරි කොටසද තරණය කල අපට කහ පැහැති මල් හා පැණි බීමට පැමිණි විශාල කළු කුරුමිණියන් විශේෂයක්ද දක්නට ලැබිණි. විනාඩි කිහිපයකින් කන්දේ මුදුනටම ගිය අපට අවට දර්ශන තලයේ දුටු දෙයින් දෙනෙත් අදහා ගැනීමට නොහැකි විය.



කටුගස්තොට දුම්රිය පාලම (ඉතා දුරින් ඇති දසුනකි)



වික්ටෝරියා වේල්ල (ඉතා දුරින් ඇති දසුනකි)

නිරිත දිගින් මහනුවර හා කටුගස්තොට, අස්ගිරිය ප්‍රදේශය හා හන්තාන කඳු වැටිය දර්ශනය වේ. විශේෂයෙන් කටුගස්තොට දුම්රිය පාලම හා මහවැලි ගඟ දිස් වේ. බටහිරට වන්නට පහල කන්දක ඇති හුන්නස්ගිරිය රූපවාහිනී විකාශන කුළුණු දැකිය හැක. ගිනිකොන දෙසින් දිගන පෙදෙස හා වික්ටෝරියා ජලාශය හා එහි වේල්ල දැකිය හැක. වයඹ දිගින් මාතලේ ප්‍රදේශයත්, උතුරින් රත්තොට කඳුත්, ඊසාන, නැගෙනහිර දිශාවන්ගෙන් නකල්ස් කඳු පංති හා රක්ෂිතයත් දකුණු දෙසට වන්නට පන්විල හා වත්තේගම ප්‍රදේශත් ඉතා ඈතින් පිදුරුතලාගල කඳුත් දැකිය හැක. කුඹුරු යායවල්, මාර්ග සහ අවට ගම්මානද හොඳින් දර්ශනය විය.

www.lakviskam.org

ක්‍රමයෙන් අහස වැහි වලාකුලින් බර වන්නට විය. එසේම තුනී මීදුම් වලාවක් කන්ද ආක්‍රමණය කරන්නටද විය. අප ගෙනා කඩල ආහාරයට ගත් අප අවට දර්ශන ජායරූපයට නගා කඳු මුදුනේ අප පැමිණි බවට සලකුණක් වශයෙන් කොඩියක්ද සිටවූයෙමු. විනාඩි 45ක කාලයක් කඳු මුදුනේ ගත කොට කන්ද බැසීම ආරම්භ කලෙමු. අප නැගීම සිදු කල මාර්ගයෙන් බැහැරව සාමාන්‍ය අඩි පාරක් ඔස්සේ කන්ද බැසීමට තීරණය කළෙමු.



කඳු මුදුන ජයගත් අප තිදෙනා



හුන්නස් දිය ඇල්ල

එසේ ගමන් කරද්දී පෙර ඇස නොගැටුණු බොහෝ දෑ අපට දැක ගත හැකි විය. කැලෑවේ කඳවුරු බැඳීමට භාවිතා කල ස්ථානයක්ද හමු විය. පැයකුත් විනාඩි 10ක් තුල සෙන්ගසාධු ගම්මානය ආසන්නයේ වූ ගල් තලාවේ මුදුනට ලඟා වීමට හැකි විය. එම ගල්තලාව ඔස්සේ ගලා එන දිය ඇලි වැනි සීතල ජල පහරෙන් නෑමට තීරණය කල අරුණත් මමත් ආරක්ෂාකාරී ස්ථානයකින් හොඳ හැටි දිය නා පිරිසිදු වූයෙමු. අපගේ මහන්සිය එයින්ම මැකී ගියේය. නැවත කළු ගල් පර්වතය සීරුවෙන් බැස අප උදේ වතුර පුරවාගත් ජල පහරට සමු දී සෙන්ගසාධු ලයින් නිවාස හරහා ඉදිරියට ගියෙමු. තේ වත්ත ඔස්සේ පල්ලම් බසිමින් සිටින විට ත්‍රීරෝද රථයක් පැමිණි අතර අප රථයේ තරුණ රියදුරුගෙන් ඇල්කඩුව පාර හන්දියට යාමට කතා කර ගත්තෙමු. කෙටි එහෙත් අබලන් මාර්ගයක් ඔස්සේ ගමන් ගන්නා අතර අඳුරු වැටෙන නිසා වත්තේගම හන්දියටම ත්‍රීරෝද රථයෙන් ගමන් කිරීමට නැවත කතා කර ගත්තෙමු. මේ අතරවාරයේ හමු වන හුන්නස් දිය ඇල්ල නැරඹීමට අප අමතක නොකළෙමු. වත්තේගම සිට මහනුවර බසයකින් ගොස් අස්ගිරියෙන් බැස අප මිත්‍ර ලසිතගේ පියා සමග ඔහුගේ නිවසට ගොස් ආහාර ගෙන අරුණත් මමත් ලසිතගේ වාහනයෙන් නුවර බලා ගියෙමු. වාසනාවට AC බස් රථයක් තිබුනෙන් රාත්‍රී 11 පමණ වන විට කොළඹකරා ගොස් 2015 වසරේ අවසාන සංචාරය එසේ සාර්ථකව නිම කිරීමට හැකි විය.

**අතිරේක යොමු**

අප සංචාරයේ තවත් ඡායාරූප එකතුවක් පහත යොමුවෙන් නරඹන්න.

https://picasaweb.google.com/102500057347588371605/HunnasgiriyaMountainClimb2015?authuser=0&feat=directlink

මෙම සංචාරයේ වීඩියෝව අපගේ යු ටියුබ් (YouTube) චැනලයෙන් නරඹන්න.

https://youtu.be/dOnN6QwYqMw

අප ගමන් කල අඩි පාරේ GPS සටහන (kml) පහත යොමුවෙන් ලබා ගන්න.

http://www.lakviskam.org/resources.html

www.LakViskam.org

---

මෙම වාර්තාවේ අයිතිය “ලක් විස්කම්”වෙබ් අඩවිය සතුය. ©www.lakviskam.org (2016 පෙබරවාරි 29)

විමසීම්සඟ අදහස් : lakviskam@gmail.com